# ජාතික අවම වැටුප වැඩි කිරීම පිළිබඳ දැනුම් දීම
# සේවකයින් හා සේවායෝජකයින් වෙත

**(2016 අංක 3 දරන ජාතික අවම වේතන පනතින් ආවරණය වන සේවකයන් සඳහා)**

2025 අප්‍රේල් 01 දින සිට ජාතික අවම **මාසික වේතනය රු. 27,000/-** දක්වා ද ජාතික අවම **දෛනික වේතනය රු. 1,080/-** දක්වාද ඉහළ නංවා ඇත.

2025 මාර්තු 31 දිනට අයවැය සහන දීමනා පනත් යටතේ හිමිකම් ලැබූ දීමනා, ඉහත වේතනයේ කොටසක් ලෙස පහත නිදසුන් පරිදි ඒකාබද්ධ කළ යුතුය.

**නිදසුන් 01**

| | **මාසික (රු.)** | **දෛනික (රු.)** |
|---|---:|---:|
| 2025.03.31 දිනට පැවති වැටුප | 17,500/- | 700/- |
| අයවැය සහන දීමනාව (2005 අංක 36 හා 2016 අංක 04 පනත්) | 3,500/- | 140/- |
| 2025.04.01 දින සිට අවම මූලික වැටුප | 27,000/- | 1,080/- |

**නිදසුන් 02**

| | **මාසික (රු.)** | **දෛනික (රු.)** |
|---|---:|---:|
| 2025.03.31 දිනට පැවති වැටුප | 26,000/- | 1,040/- |
| අයවැය සහන දීමනාව (2016 අංක 04 පනත) | 2,500/- | 100/- |
| 2025.04.01 දින සිට අවම මූලික වැටුප | 28,500/- | 1,140/- |

**නිදසුන් 03**

| | **මාසික (රු.)** | **දෛනික (රු.)** |
|---|---:|---:|
| 2025.03.31 දිනට පැවති වැටුප | 40,000/- | 1,600/- |
| අයවැය සහන දීමනාව (2016 අංක 04 පනත) | 2,500/- | 100/- |
| 2025.04.01 දින සිට අවම මූලික වැටුප | 42,500/- | 1,700/- |

**සැලකිය යුතුයි :**

මෙම වේතනය සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්ත භාර අරමුදල්, අතිකාල, පාරිතෝෂික, ප්‍රසූතිකාධාර ගෙවීම්, නිවාඩු දින ගෙවීම් යනාදී සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා අදාළ කර ගත යුතුය.

2026 ජනවාරි 01 දින සිට ජාතික අවම මාසික වේතනය රු. 30,000.00 දක්වා ද ජාතික අවම දෛනික වේතනය රු. 1,200 දක්වා ද ඉහළ නැංවිය යුතුයි.

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද**
**කම්කරු කොමසාරිස් ජනරාල්,**
**කම්කරු දෙපාර්තමේන්තුව, "මෙහෙවර පියෙස", කොළඹ 05.**
**2025.07.25**